# සිංහල




## 3 ශ්‍රේණිය

Start Your Learning Journey with e-thaksalawa
The National e-learning Portal for The General Education

**උපදෙස් :** ලිවීම කළ යුතු සෑම අවස්ථාවක දී ම ඔබේ ලිවීමේ අභ්‍යාස පොත පාවිච්චි කරන්න.



***පාඩම - දන්තජ "ස" , මූධර්ජ "ෂ" , තාලුජ ශ" යෙදෙන වචන සොයමු. /බලමු. / ලියමු.***

### *ක්‍රියාකාරකම 1*

- පහත කොටුව තුළ ඇති වචන කියවන්න.

| | | |
|---|---|---|
| පාෂාණ | විශේෂ | |
| නිදශර්න | | ප්‍රශ්න |
| උෂ්ණ | හසුන | වස්සානය |
| අත්සන | ප්‍රශංසනීය | |
| ස්නානය | ලක්ෂණ | දේශනය |
| පෝෂණය | | මූලාසනය |
| ප්‍රකාශනය | | ආසනය |
| පරීක්ෂණය | ප්‍රදශර්නය | |

ඉහත කොටුව තුළ වචන භාවිතකර වගුව සම්පූර්ණ කරන්න.

| දන්තජ "ස" | මූර්ධජ "ෂ" | තාලුජ "ශ" |
|---|---|---|
| | | |

***පාඨම - මූර්ධජ "ළ" සොයමු / බලමු / ලියමු***

## ***ක්‍රියාකාරකම 2***

- පහත සඳහන් කවි තාලයට ගායනා කරන්න

01. කන්ද උඩින් - ලන්ද පුරා
    කුරුලු පැටව් - ඉගිලෙනවා

02. ළැහැබ පුරා - ළමා ළපටි
    ඒ මේ අත - දුව යනවා

03. දිය ගෙන යන - ගැහැනු ළමයි
    ළිඳ ළඟ ඉඳ - ගී ගයනවා



04. කන්ද උඩින් - ඉර බැස යයි
    පළාතටම - අඳුර වැටෙයි





- මූර්ධජ "ළ" යෙදෙන වචන ශබ්ද නඟා කියවන්න. එම වචන ලියන්න.

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

## ක්‍රියාකාරකම 3

- මූර්ධජ "ළ" යෙදෙන වචන පෙළ පොතින් සොයා ලියන්න.

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

  ..........................................................................................

## ක්‍රියාකාරකම 4

- පෙළපොතින් සොයා ගන්නා ලද වචන පාඩමේ නමත් සමඟ පහත වගුවේ සඳහන් කරන්න.

| පාඩම | සොයා ගන්නා ලද වචන |
|---|---|
| | |

**පාඩම - මූර්ධජ "ණ" සොයමු. / බලමු. / ලියමු.**

## ක්‍රියාකාරකම 1

- පහත ඡේදය හොඳින් කියවන්න.

අපේ පාසලේ "දෙරණට අරුණ" විවිධ ප්‍රසංගයට ඇත්තේ දින කිහිපයකි. එක් එක් විශේෂාංගවලට ගැළපෙන පරිදි ආභරණ තෝරා ගත යුතු බව ගුරුතුමිය පැවසුවා ය. කල් තියා ම ආභරණ මිල දී ගත යුතු බව ගුරුතුමියගේ තීරණය විය. ඒ අනුව වරුණිගේ හා අරුණිගේ අම්මලා දෙදෙනා ම මේ කටයුත්ත භාරගත්හ. ආභරණ මිල දී ගැනීම සඳහා වරුණිගේ හා අරුණිගේ මවුවරු නගරයේ වෙළෙඳ සැලකට ගියහ. එහි විවිධ වර්ගවල ආභරණ වෙන් කොට අසුරා තිබිණි. දරුවන්ට අවශ්‍ය වළලු තෝරා ගැනීමට ආභරණ පෙට්ටි එකින් එක ගෙන සොයන්නට වූහ. සමහර පෙට්ටිවල අලුත් වළලු අතරට පරණ වළලු දමා ඇති බව මේ අයට වැටහිණි. තවත් පෙට්ටි කිහිපයක් සෝදිසි කර බැලූ වරුණිට හා අරුණිට ද පරණ වළලු කළවම් කර ඇති බව වැටහිණි. වෙළෙඳ සැල් හිමියාගෙන් කාරණ විමසා බලා මෙවැනි අසාධාරණ වෙළෙඳාම් නොකරන ලෙස ඉල්ලා සිටියහ. මෙවැනි අසාධාරණ වෙළෙඳාම් කරන අයට වන ඉරණම නීතියට හසු වීම බව පැවසූහ. වරුණි හා අරුණි, මවුවරුන් සමඟ ආභරණ ගැනීමට වෙනත් වෙළෙඳ සැලකට පියමං කළහ.

*(පොදු ගුරු මාගෝපදේශය - 3 ශ්‍රේණිය)*

## ක්‍රියාකාරකම 2

- ඉරි ඇඳි වචන දෙස හොඳින් බලන්න. එම වචන බලා ලියන්න. කියවන්න.

.....................................................................................................

.....................................................................................................

.....................................................................................................

## ක්‍රියාකාරකම 3

- පෙළ පොතෙන් මූර්ධජ "ණ" යෙදෙන වචන සොයා පහත වගුවට ඇතුළත් කරන්න.

| පාඩම | සොයා ගන්නා ලද වචන |
|---|---|
| | |

## ක්‍රියාකාරකම 4

- පහත වචන යොදා වාක්‍ය ලියන්න.

1. පරණ 2. සම්පූර්ණ 3. සාධාරණ 4. අසරණ

.............................................................................................

.............................................................................................

.............................................................................................

.............................................................................................

.............................................................................................

.............................................................................................

.............................................................................................

## ක්‍රියාකාරකම 5

- පහත ඡේදය හොඳින් කියවන්න.

මම නිමල්ට තේ උණු කරන්නට කියා ඇඟපත සෝදා ගැනීමට මඩුව පිටුපස ළිඳට ගියෙමි. දවල් වල් ඉදිරූ තැන්වල තිබුණු එළවලු පැළ හුඟ හරියක් මැලවී ගොස් තිබෙනු මගේ බැල්මට අසු විය. වැඩියෙන් ම මැලවී තිබුණේ මෑ සහ මුං පැළ ය. මෙයින් ඉතා කනස්සල්ලට පත් මම තේ බීමෙන් පසු නිමල් ද කැඳවා ගෙන විත් මැලවුණු පැළවලට වතුර වත් කරන්නට වීමි.

එහි ඇති වචන සොයා මෙම වගුව සම්පූර්ණ කරන්න.

| න | ණ | ල | ළ |
|---|---|---|---|
| | | | |

## ක්‍රියාකාරකම 6

- මව්බස කියවීම පොතේ පිටු අංක 67, 68, 69, 70, 71, 72 පිටු කියවන්න. දන්තජ "ස", මූධර්ජ "ෂ", තාලුජ "ශ", දන්තජ "න" , මූධර්ජ "ණ", දන්තජ "ල" හා මූධර්ජ "ළ" යෙදෙන වචන සොයන්න. ඒවා පහත වගුවේ සටහන් කරන්න.

| දන්තජ “ස” | මූධර්ජ “ෂ” | තාලුජ “ශ” | දන්තජ “න” |
|---|---|---|---|
| | | | |
| මූධර්ජ “ණ” | දන්තජ “ල” | මූධර්ජ “ළ” | |
| | | | |

## ක්‍රියාකාරකම 7

- පහත මලෙහි පෙතිවලට ඉදිරියෙන් අක්ෂරයක් සඳහන් කර ඇත. එම අක්ෂරය ඇතුළත් වචනය බැගින් පෙතිවල ලියන්න.




